# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/2 - 2017 මැයි මස 29 වැනි සඳුදා - 2017.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත 15(1) වගන්තිය යටතේ නියමය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා. ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 මැයි මස 24 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 මහල,
සුහුරුපාය,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්කිස්ස ගමේ පිහිටි, ගල්කිස්ස වත්ත නමැති උතුරින්, එස්. පී. වීරසිංහ යන අයගේ ඉඩම සහ ලං.ග.ම. බස් රථ ගාල ද, නැගෙනහිරින් ගාලු පාර ද, දකුණින් ස්ටේෂන් පාර ද, බටහිරින් සිමෙන්ති කාණුව ද මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි හතයි හයයි බින්දුවක් (හෙක්. 0.3760)ක් වූ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එල්. අයි. අයි. පීරිස් මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 1202 දරන මානක සැලැස්මේ කැබලි අංක 01 දරන බිම් කොටස.

06-430

1A - G 25628 — 10 (2017/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*